මගේ අංකය : JSC/SEC/CIR/2025

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් වෙත,

**2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ විධිවිධාන ප්‍රකාරව වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම**

ශීර්ෂගත කරුණ සබැඳිව ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් විසින් මා වෙත යොමු කරන ලද අංක PS/CSA/12/00/A&L General-I සහ 2025.04.30 දිනැති ලිපිය අධිකරණ සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පලකොට අවශ්‍ය කටයුතු සඳහා ඔබගේ අවධානයට ලක්කරමි.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2025 මැයි මස 22 වන දින,
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය : PS/CSA/12/00/A&L General-I
2025 අප්‍රේල් මස 30 වන දින

ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය

**2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ විධිවිධාන ප්‍රකාරව වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙහි (www.ciaboc.gov.lk) පළකර ඇති එකී කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 01/2025 හා 2025.03.27 දිනැති චක්‍රලේඛය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරමි.

02. ඒ අනුව,මධ්‍යගත ඉලෙක්ට්‍රොනික් පද්ධතියක් ස්ථාපිත කර, එමගින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා ගැනීම හා සත්‍යායනය කිරීමේ වගකීම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පැවරී ඇති අතර, කොමිෂන් සභාව විසින් දැනටමත් ආරම්භ කර ඇති මෙම මධ්‍යගත ඉලෙක්ට්‍රොනික් පද්ධතිය බලාත්මකභාවයට පත්වන තෙක්, සංක්‍රාන්ති කාලසීමාව තුළ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලිය 83 (7) වගන්තිය ප්‍රකාරව අතින් ඉදිරිපත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් අවසරය ලබාදී ඇත.

03. එකී චක්‍රලේඛයේ ඇමුණුම II අනුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111(2) ව්‍යවස්ථාව ප්‍රකාරව ගරු ජනාධිපතිතුමන් විසින් පත් කරන ලද මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ, වත්කම් හා බැරකම් ප්‍රකාශ බාරගත යුතු තැනැත්තා වශයෙන් ගරු ජනාධිපතිතුමා සඳහන් කර ඇත.

04. එබැවින්, 2025.03.31 දින වන විට සේවයේ නියුතු ඉහත කී මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ 2025 මාර්තු මස 31 වන දිනට පැවති වත්කම් හා බැරකම් ප්‍රකාශය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ දක්වා ඇති ඩිජිටල් ආකෘතිය අනුව පුරවා, එහි අත්සන් කරන ලද මුද්‍රිත පිටපත, ලිපි කවරයක බහා, මුද්‍රා තබා, වම්පස උඩ කෙළවර <u>" රහසයි" - වත්කම් හා බැරකම් ප්‍රකාශ අංශය - CIABOC</u> යනුවෙන් ලියා එම කවරයේ මතුපිට " නම, තනතුර සහ 2025 මාර්තු මස 31 දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශය" යනුවෙන් සඳහන් කර <u>2025 ජුනි මස 30 දින හෝ එදිනට පෙර</u> ජනාධිපති කාර්යාලය වෙත එවීමට කටයුතු කරන මෙන් ගරු මහාධිකරණ විනිශ්චයකාරවරුන් දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

05. තවද, ගරු මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ පහත සඳහන් තොරතුරු 2025 මැයි මස 30 දිනට ප්‍රථම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස අප වෙත දන්වා ඇති බැවින් එම තොරතුරු 2025.05.15 දිනට පෙර MS Excel මගින් ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කර kpchandith@presidentsoffice.lk ඊමේල් ලිපිනය වෙත යොමු කරන ලෙසද කාරුණිකව ඉල්ලමි.

| Serial No. | Full Name | Designation | Institution | NIC | TIN | Mobile Number | Email |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ජී.පී.එච්.එම්. කුමාරසිංහ
ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

අ/කළේ කේ. ප්‍රසන්න චන්දිත්
ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්

දුරකථන : 0112 354303
ෆැක්ස් : 0112 331246
විද්‍යුත් තැපැල : sas4.csa@presidentsoffice.lk

පිටපත : අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව